ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Statement No: HRC/S/i/S/03/02/26

# ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශනයේ නිදහස සහ අන්තර්ජාලය තුළ ආරක්ෂාව

ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශනයේ නිදහසට එරෙහිව මතුවන තර්ජන පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු වී ඇති අතර, විශේෂයෙන් මාධ්‍යවේදීන්හට බාධාවලින් තොරව තම රාජකාරියෙහි යෙදීමට ඇති නිදහස පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් මාධ්‍යවේදීන් ද ඇතුළුව සිදු කළා යැයි උපකල්පිත අපහාසාත්මක ප්‍රකාශන පිළිබඳ පරීක්ෂණ පවත්වමින් මෙකී නිදහසට අවහිර කිරීමේ ප්‍රවණතාවයක් මතුවී ඇති බව නිරීක්ෂණය විය. මාධ්‍යවේදියකු මෙන්ම කොමිෂන් සභාවේ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ උප කමිටු සාමාජිකයකු ද වන තරිඳු ජයවර්ධන මහතා නිසි හේතු අනාවරණයකින් තොරව විමර්ශනයක් සඳහා පොලිස් ස්ථානය වෙත කැඳවීම මෑත කාලීනව සිදු වූ බරපතලම උදාහරණයකි. පසුව හෙළි වූයේ ජයවර්ධන මහතා විසින් පොදු අරමුදල් අවභාවිතය පිළිබඳව සිදු කරන ලද ප්‍රකාශනය තුළ උපකල්පිත අපහාසාත්මක ප්‍රකාශන තිබූ බැවින් එසේ කැඳවා ඇති බවයි. මෙලෙස හේතු දැක්වීමකින් තොරව කැඳවීම, සියලු පරීක්ෂණ නිලධාරීන් පුද්ගලයින් කැඳවීමේදී හේතු දැනුම් දිය යුතුයැයි දැනුම් දෙමින්, 2025 ජූලි 02 දින පොලිස්පතිතුමා විසින් නිකුත් කළ RTM 101/CRTM 61 චක්‍රලේඛය උල්ලංඝනය කිරීමක් වන බව ද කොමිෂන් සභාව අවධානයට ගනී.

ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශනයේ නිදහස ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇත. අදහස් හා මතවාද ප්‍රකාශ කිරීම හා එමගින් ප්‍රජාතන්ත්‍ර ක්‍රියාවලියට සම්බන්ධ වීම සඳහා සියලු පුරවැසියන්හට එය අත්‍යවශ්‍ය ඉතා වැදගත් මූලික අයිතියකි. මෙම අයිතිය මගින් මාර්ගගත වේදිකාද ඇතුළුව ඕනෑම මාධ්‍යයක් හරහා සිදු කරන සියලු ආකාරයේ ප්‍රකාශන ආරක්ෂා කරයි. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇති පරිදි, මෙම අයිතිය ‘අප එකඟ වන හෝ වරදකාරී නොවේයැයි හැඟෙන තොරතුරු සහ අදහස් පමණක් නොව… රාජ්‍යය හෝ ජනගහණයේ ඕනෑම කොටසක් කනස්සල්ලට හෝ කැළඹීමට ලක් කරන අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියද ආරක්ෂා කරයි.

එම අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) සහ 15(7) ව්‍යවස්ථාව යටතේ පනවන නීති සීමා මගින් පමණක් සීමා වේ. ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් තීරණය කර ඇත්තේ, ප්‍රකාශන අයිතියට පනවන සෑම සීමාවක්ම අවශ්‍යතාවය, සාපේක්ෂතාවය සහ සාධාරණභාවය යන මූලධර්මයන්ට අනුකූල විය යුතු බවයි. ප්‍රකාශන අයිතියට අත්‍යවශ්‍ය නොවන, සාපේක්ෂ නොවන සහ අසාධාරණ සීමා පැනවීම සමාජයට දැඩි අවදානමක් බවත් එවැනි සීමා ජනතාව අතර අප්‍රසාදය හා නොසන්සුන්තාවයක්ද ඇති කළ හැකි බවද කොමිෂන් සභාව අවධාරණය කරයි.

15(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රකාශනයේ නිදහස සීමා කළ හැකි එක් අවස්ථාවක් වනුයේ අපහාසාත්මක ප්‍රකාශන කිරීමයි. එබැවින්, අවශ්‍යතාවය, සාපේක්ෂතාවය සහ සාධාරණභාවය යන මූලධර්මයන්ට අනුකූල

සීමා පැනවිය හැකි අතර, එම සීමා සෑම පුද්ගලයෙකුටම ඔවුන්ගේ කීර්තිය හා පෞද්ගලිකත්වය පිළිබඳ අයිතිය සහතික කිරීමටත්, අපකීර්තියෙන් ආරක්ෂා කිරීමටත් අරමුණු කරයි. සිවිල් අධිකරණ නියෝග සහ තීන්දුවලින් එවැනි සීමා මොනවාද යන්න පැහැදිලි කරයි. කෙසේ වෙතත් මාධ්‍යවේදීන් සහ සම්පාදකයින් (කතුවරුන්) ඇතුළු සියලු පුද්ගලයන් ප්‍රකාශන අයිතිය භාවිතා කරන අවස්ථාවලදී, අන්‍යයන්ගේ අයිතිවාසිකම් සහ කීර්තියට ගරු කිරීම පිළිබඳ 'විශේෂ කාර්යභාරයක් සහ වගකීමක්' පවතී. මෙම රීතිය සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 19(3) වගන්තියෙහි පැහැදිලි කර ඇත. එබැවින්, මාධ්‍යවේදීන් සහ සම්පාදකයින් විසින් ප්‍රකාශන අන්තර්ගතය නිවැරදි බවට පරීක්ෂා කර තහවුරු කර ගත යුතු අතර, චෝදනා යොමු කරන ලද අවස්ථාවලදී ඊට අදාළ පාර්ශවයන්ටත් සම්බන්ධ වී අදහස් දැක්වීමට හෝ ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දිය යුතුය. තවද, ප්‍රකාශයට පත් වී ඇති අන්තර්ගතය සාවද්‍ය බව හඳුනාගැනෙන විට, ඒවා නිවැරදි කිරීමටත්, සමාව ඉල්ලා ප්‍රකාශන නිකුත් කිරීමටත් නොපමාව කටයුතු කළ යුතුය.

අපකීර්තිය වැළැක්වීමේ අරමුණින්, ප්‍රකාශන අයිතිය අපරාධ වරදක් ලෙස සැළකීමට හැකි බවට පොදු වැරදි අදහසක් පවතී. අපකීර්තියක් ලෙස සැලකෙන හේතුව මත පුද්ගලයෙකුගේ කථනය සීමා කිරීම සිවිල් අධිකරණයේ විශේෂ බල සීමාවට අයත් වේ. ශ්‍රී ලංකා අපරාධ නීතිය යටතේ වර්තමානයේ අපකීර්තිමත් ප්‍රකාශ කිරීම අපරාධමය වරදක් ලෙස හඳුනාගෙන නැත. 2002 අංක 12 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධිත) පනත මගින් අපකීර්තිය සම්බන්ධ ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ XIX පරිච්ඡේදය ඉවත් කරනු ලැබ ඇත. එමනිසා, අපකීර්තිමත් ප්‍රකාශන සම්බන්ධව විමර්ශනය කිරීමට ශ්‍රී ලංකා පොලිසිය හට කිසිඳු නීතිමය බලයක් පැවරී නොමැත. පොලිසිය එවැනි පැමිණිලි බාරගැනීම හෝ විමර්ශන කිරීම නොකළ යුතුය. අපකීර්තිමත් යැයි පුරෝකථිත ප්‍රකාශයක් මගින් අගතියට පත් ඕනෑම පුරවැසියකු සිවිල් අධිකරණයක් ඉදිරියේ පිළියමක් අයැදිය හැකි අතර, අපරාධමය පැමිණිල්ලක් ගොනු කළ නොහැක.

දේශපාලන ක්‍රියාකාරීන් සහ බලවත් චරිත විසින්, ඔවුන් පිළිබඳව අන්තර්ජාලය ඇතුළු විවිධ මාධ්‍ය වේදිකාවලදී ප්‍රකාශිත බවට කියන වැරදි හෝ අපහාසකාරී ප්‍රකාශ සම්බන්ධයෙන්, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට හෝ පරිගණක අපරාධ විමර්ශන අංශය ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ අනෙකුත් විශේෂිත අංශයන්ට පැමිණිලි ඉදිරිපත් කිරීමට උත්සාහ කරන ප්‍රවණතාවයක් පවතින බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් අනුව, දේශපාලන නායකයන් සහ රාජ්‍ය නිලධාරීන් වැනි මහජන නියෝජිතයන්, තනි පුද්ගලයන්ට වඩා විවේචන ඉවසීමකින් යුක්ත වියයුතු බව කොමිෂන් සභාව අවධාරණය කරයි. ජනතාවගේ අදහස් ප්‍රකාශන නිදහසට ගෞරව කිරීමේ විශේෂ වගකීම් එවැනි තැනැත්තන්ට පවතින බැවින් අපහාසකාරී බවට උපකල්පිත ප්‍රකාශ සම්බන්ධයෙන් විමර්ශන කිරීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් මත අධික ලෙස රඳා නොපැවතිය යුතු බව කොමිෂන් සභාව වැඩිදුරටත් අවධාරණය කරයි. බොහෝ විට එවැනි පුද්ගලයින් සම්බන්ධව වැරදි සහ අසාධාරණ ප්‍රකාශ මහජනයා විසින් කරනු ලබයි. කෙසේවෙතත්, නීති ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහාය මත රඳා නොපැවතී, නිල පැහැදිලි කිරීම් නිකුත් කිරීම වැනි සමානුපාතික ක්‍රියාමාර්ග මගින් එවැනි ප්‍රකාශ වලට ප්‍රතිචාර දැක්වීම ඔවුන්ගේ වගකීම වන බව ද කොමිෂන් සභාව සිහිපත් කරයි. තවද, දේශපාලනයේ යෙදෙන කාන්තාවන් පිළිබඳ සමාජ මාධ්‍ය තුළ මෙන්ම සම්ප්‍රදායික මාධ්‍ය තුළද කෙරෙන බොහෝ විවේචන හානිදායි බව මෙම කොමිෂන් සභාව මීට පෙර අනාවරණය වී ඇත. මෙම බරපතල ගැටලුව විසඳිය හැකි වන්නේ අපරාධ නීතිය අවභාවිතයෙන් නොව දීර්ඝකාලීන සමාජීය මැදිහත්වීම මගින්ය.

මෙම සන්දර්භය තුළ කොමිෂන් සභාව 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත පිළිබඳ අදහස් දැක්වීමට අපේක්ෂා කරයි. කොමිෂන් සභාව විසින් මීට පෙර අවස්ථාවකදීද හිටපු කථානායක වෙත යොමු කරන ලද ලිපියක් මගින් මෙම පනතේ කරුණු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය හා අනුකූල නොවන බවට මෙන්ම මෙම පනත පාර්ලිමේන්තු අතිවිශේෂ බහුතර ඡන්දයකින් පමණක් සම්මත කළ යුතු බවත් පැහැදිලි කර ඇත. මෙම පනත භාවිතා කරමින් අපහාසාත්මක ප්‍රකාශ වැළැක්වීමට කටයුතු

කිරීමේදී පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශන නිදහස සීමා කිරීම මගින් මෙම පනතේ ව්‍යවස්ථානුකූලත්වය පිළිබඳ බරපතල ගැටලු මතු කරයි.

අන්තර්ජාලය තුළ පුද්ගල ආරක්ෂාව නිත්‍ය අරමුණක් බවත් මාර්ගගත වේදිකා තුළ ආරක්ෂාව, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි තැනැත්තන් හට (vulnerable), අත්‍යවශ්‍ය වන බවත් කොමිෂන් සභාව පිළිගනියි. කෙසේ වෙතත් මෙම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත එම අරමුණ සාක්ෂාත් නොකරන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි. එහි විධිවිධාන දණ්ඩ නීති සංග්‍රහයේ දක්නට ලැබෙන යටත් විජිත යුගයේ අපරාධ වැරදි අනුකරණය කරන අතර, තතුබෑම් (phishing), ඔත්තු මෘදුකාංග(spyware), අගතිගාමී මෘදුකාංග(malware), සේවා ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රියා (denial-of-service attacks) සහ අනවසරයෙන් ඇතුළුවීම (hacking) වැනි මාර්ගගත සැබෑ ආරක්ෂක ගැටලු ගණනාවක් නිසි ලෙස ආමන්ත්‍රණය කිරීමට මෙකී පනත අපොහොසත් වේ. කොමිෂන් සභාව මෑතකදී සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමඟ මේ සම්බන්ධව සාකච්ඡාවක් පැවැත්වූ අතර, මෙම පනත අවලංගු කළ යුතු බවට පුළුල් එකඟතාවයක් ඇති බව එහිදී නිරීක්ෂණය විය. අන්තර්ජාල ආරක්ෂාව පිළිබඳ නව නීති විධිවිධාන කෙටුම්පත් කිරීමේ ඕනෑම ක්‍රියාවලියක් කතිකාවතක් මත සිදු විය යුතු අතර, එකී විධිවිධාන අරමුණු සඳහා ගැළපෙන බවට සහතික කිරීම සඳහා ඒ සම්බන්ධ අත්දැකීම් සහ විශේෂඥතාව ලබා ගත යුතුය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට පූර්ණ අනුකූලව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ අදාළ බලධාරී ආයතන පහත සඳහන් පියවර ගත යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි:

1. අධිකරණ අමාත්‍යාංශය විසින් මාර්ගගත ආරක්ෂණ පනත වෙනුවට සුදුසු නීති සම්පාදන විධිවිධාන සමඟ නව පනතක් ප්‍රතිස්ථාපනය කරන තෙක්, එහි භාවිතය අත්හිටුවීමක් ප්‍රකාශයට පත් කළ යුතුය.
2. අපහාස කිරීමක් පමණක් ශ්‍රී ලංකාවේ සාපරාධී වරදක් නොවන බව සිහිපත් කරමින්, පොලිස්පතිවරයා විසින් ශ්‍රී ලංකා පොලිසියේ සියලුම අංශ සහ පොලිස් ස්ථාන වෙත නියමයක් නිකුත් කළ යුතු අතර, වෙනත් කිසිඳු වරදකට සාධාරණ ලෙස සැක නොකරන විට, උපකල්පිත අපහාස සම්බන්ධයෙන් පමණක් පැමිණිලි වාර්තා කිරීමෙන් හෝ විමර්ශනය කිරීමෙන් වැළකිය යුතු බව දැනුම්දිය යුතු බව සහ
3. අසත්‍ය හෝ අපහාසාත්මක යැයි කියන ඕනෑම ප්‍රකාශයක් අපරාධ වරදක් ලෙස නොසැලකෙන බැවින් දේශපාලන නායකයන් විසින් ඒ සම්බන්ධයෙන් අපරාධ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් වෙත පැමිණිලි කිරීමෙන් වැළකී සිටිය යුතුය.

සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2026.02.03